**දිඹුලාගල ප්‍රාදේශීය සභාව - 2021**

------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1)(ඈ)( iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලනයට අදාල රීති අංක 97 අනුව ප්‍රාදේශීය සභාවක් පිළියෙල කළ අයවැයගත තොරතුරු, ඊට අදාළ කාලච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සහ වැදගත් ගිණුම්කරණ සටහන් තුළ අයවැයගත තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පළාත් පාලන ආයතනයක් විසින් වාර්ෂික අයවැය සකස්කර ඉදිරිපත් කරනු ලබන්නේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 හා 169 වගන්ති ප්‍රකාරව රීති මඟින් ලබාදී ඇති සම්මත ආකෘති පදනම් කරගෙනය. එබැවින් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ අයවැයගත තොරතුරු ඉදිරිපත් කළ නොහැක. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2020 ජූලි 03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශිත ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති 2020 ජනවාරි 01 දින සිට අනුගමනය කළ යුතු බැවින් රීති ප්‍රකාරව අයවැයගත තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | දේපළ පිරියත උපකරණ ක්ෂය කිරීම් යටතේ ආරම්භක ශේෂය, වාර්ෂික ක්ෂය හා අවසාන ශේෂය ඇතුළත් කර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට දේපළ පිරියත උපකරණ වල ශුද්ධ පොත් අගය සටහන් මඟින් හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 16 යටතේ එම තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වේ. | මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය හෙළිදරව් කිරීම් නිවැරදිව කළ යුතුවේ. |

## 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් පිළිබඳ උපලේඛනය අනුව එකතු වටිනාකම රු.193,732,600 ක් වුවත් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.194,232,600 ක් ලෙස දක්වා තිබීම නිසා රු.500,000 කින් ඉඩම් වටිනාකම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉඩම් පිළිබඳ උපලේඛනයේ වෙනත් භූමි මාතෘකාව යටතේ රු. 500,000 ක වටිනාකමක් වැඩියෙන් ගිණුම්ගත වී ඇත. එය 2022 වර්ෂයේ නිවැරැදි කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | නිවැරදිව වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති සමඟ ඉදිරිපත් කර ඇති පරිශිෂ්ඨය 2 හි EG 10.1 ප්‍රකාරව ඉදිවෙමින් පවතින වත්කම් ගිණුම් තැබීමේදී වර්ෂ අවසාන නිමවුම් ප්‍රතිශතය පදනම් කරගෙන ගිණුම් තැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් ආරම්භ කර ඉදිවෙමින් පවතින ගොඩනැගිලි 13 ක නිමවුම් ප්‍රතිශතය නොසලකා ගිවිසුම් වටිනාකම ගිණුම් තැබීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.22,451,072 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ඉදිවෙමින් පවතින වත්කම් නිවැරැදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | නිමැවුම් වටිනාකම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තාවකාලිකව ඉදිකිරීම් කටයුතු නවතා ඇති නිමැවුම් ප්‍රතිශතය සියයට 0 ක් වන ව්‍යාපෘති දෙකක වටිනාකම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.6,935,260 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පවතින ආර්ථික අර්බුදයත් සමඟ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු තාවකාලිව නතර කර ඇති අතර, ඉදිවෙමින් පවතින වත්කමක් ලෙස ගිණුම්ගතකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | නිමවුම් ප්‍රතිශතය සියයට 0 ක් වන බැවින් ඉදිවෙමින් පවතින වත්කම් යටතේද වටිනාකමක් ඇතුළත් නොකළ යුතුවේ. |
| (ඈ) | 2020 වර්ෂයේ සිදුවූ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කිරීම් යටතේ එකතු කරන ලද එකතුව රු.1,862,207 ක් වූ වත්කම් ක්ෂය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වටිනාකම රු.99,045 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ක්ෂය ගැලපීම සිදුකර නිවැරැදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි . | නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඉ) | ඉදිකිරීම් සිදුකර නොතිබූ ව්‍යාපෘති 17 කට අදාළ ඇස්තමේන්තු වටිනාකම රු.224,695,997 ක් පාලම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් දේපළ පිරියත උපකරණ වටිනාකම සහ | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරැදි කරන බව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්ත ණයහිමි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ වත්කම් අයිතම 25 ක වටිනාකම රු.1,292,510 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් දේපළ පිරියත උපකරණ වටිනාකම හා ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | එකඟ වේ. අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (උ) | දේපළ පිරියත හා උපකරණ ශුද්ධ අගය වත්කම් වගකීම් ප්‍රකාශයේ නිරූපණය කළ යුතු වුවත්, දේපළ පිරියත හා උපකරණ ශුද්ධ අගයට නොපෙන්වා පොත් අගයට ඇතුළත් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය වෙන්කිරීම් රු.32,760,643 ක් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුළ දක්වා එම ශේෂය සමුච්චිත අතිරික්තයට එකතු කර දක්වා තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | හෙළිදරව් කිරීම් නිවැරදිව සිදුකළ යුතුවේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුළ ගෙවා අවසන් තැන්පතු ශේෂ 06 ක වටිනාකම රු.624,083 ක් ටෙන්ඩර් තැන්පත් ශේෂය තුළ ඇතුළත්ව තිබීම හේතුවෙන් ටෙන්ඩර් තැන්පත් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.26,935,949 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.26,164,616 ක් වූයෙන් ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.771,333 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඒ) | 2020 අගෝස්තු සිට නොවැම්බර් දක්වා මාස 04 කට අදාළ රු.279,000 ක් වූ මුද්දර ගාස්තු ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මුද්දර ගාස්තු ආදායම රු.279,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජල කර්මාන්ත ගබඩා තොග ශේෂය රු.871,415 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරදි කරන බව දන්වා සිටිමි. | |

| | | | |
|---|---|---|---|
| (ඕ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ ඉදිරිපත් කර ඇති පරිශිෂ්ඨය 2 හි EG 2.7 ට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරමින් පවතින ව්‍යාපෘති හා අවලංගු කරන ලද ව්‍යාපෘති වලට අදාළව රු.96,057,163 ක් ක්ෂය ගණනය කළ පදනමට විස්තීරණ ආදායම් ප්‍රකාශයට වර්ෂයේ හඳුනාගැනීම ලෙස බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් සහ අතිරික්තයේ/ ඌණතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරැදි කරන බව දන්වා සිටිමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ක) | මාර්ගයක් කුට්ටි ගල් ඇල්ලීමේ ව්‍යාපෘතියක වැඩ සමාලෝචිත වර්ෂයේ මාර්තු 12 දින අවසන්ව තිබූ බැවින් ප්‍රාදේශීය සභාවේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව එම ව්‍යාපෘතියට අදාළව ක්ෂය ගණනය කළ පදනම මත විස්තීරණ ආදායම් ප්‍රකාශයට බැරකළ යුතු වටිනාකමක් නොමැතිව තිබියදී එම ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂයේ ලද රු.4,520,000 ක මුදල අතිරික්තයේ හෝ (ඌණතාවයේ) ඇතුළත් කර නොමැති ප්‍රාග්ධන වියදම් දීමනා යටතේ දැක්විය යුතු වුවත් එම මුදල සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරැදි කරන බව දන්වා සිටිමි. | |
| (ග) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විවධ ණයහිමි වටිනාකම රු.1,321,532 ක් ණයහිමි ගිණුමෙන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරැදි කරන බව දන්වා සිටිමි. | |
| (ජ) | සමාලෝචිත වර්ෂයට අදාලව විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල විගණන ගාස්තු රු.126,600 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ගැලපීම් සිදුකර නිවැරැදි කරන බව දන්වා සිටිමි. | විගණන ගාස්තු නිවැරදිව ගිණුම්ගත කර නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 2. මුල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ අයභාරය රු.81,844,803 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්මවූ වියදම රු.20,167,989 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

---------------------------

**2.2.1** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුද්ගලික 6381 ක්, රාජ්‍ය ආයතන 173 ක් හා වාණිජ ආයතන 198 ක් වශයෙන් ජල පාරිභෝගිකයින් 6752 ක ගෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තු ආදායම රු.13,297,828 ක් අයකර ගැනීමට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, හිඟයෙන් අයකරගත හැකි හා නොහැකි වටිනාකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ හිඟ ජලගාස්තු ආදායම සැලකිය යුතු මට්ටමින් අඩුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කඩකාමර 25 කින් අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම් රු.1,694,401 ක් ද, සතිපොළ 05 කින් අයවිය යුතු හිඟ සතිපොළ බදු ආදායම් රු.2,238,631 ක්ද විය. ඉන් පිළිවෙලින් රු.271,280 ක් හා රු.1,282,758 කට අදාළව ගිවිසුම් නොමැතිවීම හේතුවෙන් නීතිමය පියවර ගැනීමට නොහැකිව තිබූ අතර, අයකරගත හැකි ශේෂ අයකර ගැනීමට අදාළව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටද සභාව කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂය තුළ හිඟ කුලී ආදායම සැලකිය යුතු මට්ටමින් අඩුකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව වෙළඳපොළවල් 79 කින් රු.61,000 ක්ද, ව්‍යාපාර 326 කින් රු.448,080 ක්ද, කර්මාන්ත 131 කින් රු.124,000 ක්ද වශයෙන් හිඟව පවතින රු.633,080 ක ශේෂයක් සහ 2021 වර්ෂයට පෙර සිට හිඟව පවතින රු.1,634,655 ක ශේෂයක් අයකර ගැනීම සඳහා අදාළ ආයතන වෙත ලිපි මඟින් දැනුවත් කිරීම හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ ආදායම අයකර ගැනීමට කඩිනමින් අවශ්‍ය කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019,2020 වර්ෂවලට අදාළව ලැබිය යුතු වාහන හා යන්ත්‍ර කුලී ශේෂ 06 ක වටිනාකම රු.152,134 ක් අයකර ගැනීමට කටයුතු කර නොමැති අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.646,734 ක් වූ අතර ඉන් රු.240,284 ක් වූ ශේෂ 13 ක් සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් අයවිය යුතුව පැවතුණි. | කඩිනමින් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ බව දන්වා සිටිමි. | නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. |